Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School



පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

**(01)**

**a)** වස්තුවක තාප ධාරිතාව හා විශිෂ්ට තාප ධාරිතාව අර්ථ දක්වන්න.

කුඩා ජල ප්‍රමාණයක් අඩංගු කුඩා බඳුනක් තුළ ඇති ජලය (1 *l*) උණුසුම් කිරීමට තාප දඟරයක් භාවිතයෙන් ජලයේ උෂ්ණත්වය, තාපාංකය දක්වා ඉහළ දැමිය හැක. නමුත් විශාල බඳුනක ඇති ජලය විශාල ප්‍රමාණයක් (100 *l*) තාපාංකය දක්වා උණුසුම් කිරීමට තාප දඟරයක් ප්‍රමාණවත් නොවේ. මෙයට හේතු පැහැදිලි කරන්න.







**b)** සේවකයන් විශාල සංඛ්‍යාවක් සේවය කරන කර්මාන්තශාලාවක පවත්වාගෙන යන ආපන ශාලාවක ජලය උණුසුම් කිරීම සඳහා රූපයේ පෙන්වා ඇති පරිදි තඹ බොයිලේරුවක් යොදාගනී. එය 2000 W ක තාප දඟරයකින් සමන්විත වන අතර, එකවර ජලය 30 *l* ක් පමණ රත් කිරීමට පහසුකම් ඇත. මෙහි $T_1$, $T_2$, $T_3$ කරාම තුනක් ඇති අතර, $T_1$ කරාමය විවෘත කිරීමෙන් හුමාලය පිටතට යාමටත්, $T_2$ කරාමය විවෘත කිරීමෙන් සිසිල් ජලය ඇතුළු කිරීමටත්, $T_3$ කරාමය විවෘත කිරීමෙන් උණුසුම් ජලය පිටතට ගැනීමටත් හැකිය.




i. $T_2$ හා $T_3$ කරාම වසා $T_1$ කරාමය විවෘත කර ඇති අවස්ථාවේ බොයිලේරුව තුළ ඇති ජලය 30 °C සිට 100°C දක්වා උණුසුම් කිරීමට ගතවන කාලය සොයන්න. (ජලයේ වි.තා.ධා. 4200 $Jkg^{-1}K^{-1}$, බොයිලේරුවේ තාප ධාරිතාව 6000 $Jk^{-1}$)

ii. ජලය 100°C ට ළඟාවීමෙන් පසු තවදුරටත් $T_1$ කරාමය විවෘතව පවතී නම් එම කරාමය තුළින් හුමාලය පිටවීමේ සීඝ්‍රතාවය සොයන්න. ( ජලයේ වාෂ්පීකරණයේ වි.ගු.තා. $2 \times 10^6 Jk^{-1}$)